**පීපල්ස් ලීසිං ප්‍රොපටී ඩිවලොප්මන්ට් ලිමිටඩ් - 2024/ 2025**

**-----------------------------------------------------------------**

## 1.1 මතය

පීපල්ස් ලීසිං ප්‍රොපටී ඩිවලොප්මන්ට් ලිමිටඩ් (" සමාගම") හි 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම විසින් පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 සම්බන්ධිත පාර්ශ්වයන් සහ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| වර්ෂ 05 කාලයක සිට සම්බන්ධිත පාර්ශවයන් වෙතින් ලැබිය යුතු හිඟ මුදල් රු. 4,931,450 ක් පවතින බව නිරීක්ෂණය විය. නැවත අයකරගැනීම තහවුරු කරගැනීම සඳහා ලැබිය යුතු මුදල නැවත තක්සේරු කිරීමක් සඳහා සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | සම්බන්ධිත පාර්ශවයන්ගෙන් පිළිවෙලින් හිඟ මුදල් අයකර ගැනීම සඳහා මූල්‍ය අංශය විසින් කටයුතු කරනු ඇත. | එවැනි ලැබිය යුතු ගිණුම්වල නිරවද්‍යතාවය සහ අයකරගත හැකි බව සහතික කිරීම සඳහා, සමාගම කාලානුරූපි සැසඳුම් ක්‍රියාත්මක කිරීම, පැහැදිලි පියවීම් කාලසීමා ස්ථාපිත කිරීම, සහ ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලිඛිත තහවුරු කිරීම් ලබා ගැනීම මඟින් ආශ්‍රිත පාර්ශව ශේෂයන් පිළිබඳ සිය අධීක්ෂණ පාලනයන් ශක්තිමත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 322,456,892 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 466,635,621 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 144,178,729 ක පිරිහීමක් නිරීක්ෂණය විය. 2024 වර්ෂයේදී රු. 450,000,000 ක් වූ ආයෝජන දේපල මත ලබාගත් සාධාරණ අගය 2025 වර්ෂයේදී රු. 250, 000,000 ක් දක්වා අඩුවීම, දළ ලාභ ආන්තිකය අඩුවීම සහ මූල්‍ය පිරිවැය වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන හේතු වී ඇත.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයන් පහත වගුවේ දැක්වේ.

| **වර්ෂය** | **2024/2025** | **2023/2024** | **2022/2023** | **2021/2022** | **2020/2021** |
|---|---|---|---|---|---|
| | **Rs.** | **Rs.** | **Rs.** | **Rs.** | **Rs.** |
| **සමාගම** | | | | | |
| **ආදායම** | **294,289,593** | **291,836,948** | **282,508,820** | **278,685,975** | **282,256,000** |
| විචලනය | 2,452,645 | 9,328,128 | 3,822,845 | (3,570,025) | (18,211,810) |
| වැඩිවීම /(අඩුවීම ) % | 0.84% | 3.30% | 1.37% | -1.26% | -6.06% |
| **ඍජු මෙහෙයුම් වියදම්** | **51,517,245** | **59,518,979** | **30,267,751** | **39,658,899** | **29,802,297** |
| විචලනය | (8,001,734) | 29,251,228 | (9,391,148) | 9,856,602 | (8,765,673) |
| වැඩිවීම /(අඩුවීම ) % | -13.44% | 96.64% | -23.68% | 33.07% | -22.73% |
| **පරිපාලන වියදම්** | **10,426,179** | **12,327,211** | **8,717,109** | **7,740,185** | **6,748,709** |
| විචලනය | (1,901,032) | 3,610,102 | 976,924 | 991,476 | (3,960,436) |
| වැඩිවීම /(අඩුවීම) % | -15.42% | 41.41% | 12.62% | 14.69% | -36.98% |
| **ආදායම් බදු වියදම්** | **83,026,495** | **130,181,871** | **125,318,083** | **63,524,187** | **35,527,961** |
| විචලනය | (47,155,376) | 4,863,788 | 61,793,896 | 27,996,226 | (34,424,447) |
| වැඩිවීම /(අඩුවීම) % | -36.22% | 3.88% | 97.28% | 78.80% | -49.21% |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **322,456,892** | **466,635,621** | **398,310,971** | **240,622,829** | **182,498,790** |

| | | | | | |
|---|---|---|---|---|---|
| විචලනය | (144,178,729) | 68,324,650 | 157,688,142 | 58,124,039 | (60,422,746) |
| වැඩිවීම /(අඩුවීම) % | -30.90% | 17.15% | 65.53% | 31.85% | -24.87% |
| **බදු පෙර ලාභය** | **405,483,387** | **596,817,492** | **523,629,054** | **304,147,016** | **218,026,751** |
| විචලනය | (191,334,105) | 73,188,438 | 219,482,038 | 86,120,265 | (94,847,193) |
| වැඩිවීම /(අඩුවීම) % | -32.06% | 13.98% | 72.16% | 39.50% | -30.31% |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයන් හි සමාගමේ වැදගත් අනුපාත කීපයක් පහත දැක්වේ.

| **සමාගමේ විශේෂ අනුපාත** | **2024/25** | **2023/24** | **2022/23** | **2021/22** | **2020/21** |
|---|---|---|---|---|---|
| වත්කම් මත ප්‍රතිලාභය (%) | 8.35 | 13.25 | 13.01 | 8.88 | 7.03 |
| හිමිකම් මත ප්‍රතිලාභය (%) | 11.48 | 18.52 | 19.13 | 13.37 | 10.94 |
| දළ ලාභ අනුපාතය (%) | 82.49 | 79.61 | 89.29 | 85.77 | 89.44 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 109.57 | 159.9 | 140.99 | 86.34 | 64.66 |
| ණය ස්කන්ධ අනුපාතය (වාර ගණන ) | 0.37 | 0.4 | 0.47 | 0.51 | 0.37 |
| ජංගම අනුපාතය (වාර ගණන ) | 1.28 | 2.9 | 1.12 | 1.64 | 3.01 |